# අඞ්ගුත්තර නිකායාන්තර්ගත විනය සම්ප්‍රදායගත

## කරුණු

2509

1965

36890

# පටුන

| | | පිටු |
|---|---|---|
| 1. | බුද්ධශාසනය | 1 - 2 |
| | ත්‍රිවිධශාසනය | |
| | ශාසනයේ ආරම්භය | |
| | ශාසනයේ ව්‍යාප්තිය | |
| 2. | පැවිද්ද | 3 - 4 |
| 3. | ශික්‍ෂාප්‍රඥප්තිය | 5 - 6 |
| 4. | ආසවට්ඨානීය ධම්ම | 7 - 8 |
| | රත්තඤ්ඤු මහත්ත | |
| | වේපුල්ල මහත්ත | |
| | ලාභග්ග මහත්ත | |
| | බාහුසච්ච මහත්ත | |
| 5. | සිකපද පැණවූ කාලය | 9 - 13 |
| | සික්ඛාපද යන්නෙහි අර්ථ | |
| | ශික්‍ෂාපද කොටස් | |
| | ආපත්තික්ඛන්ධ | |
| | විපත්ති | |
| | සිකපද පැනවීමේ අනුසස් | |
| 6. | විනය | 13 - 17 |
| | විනය ප්‍රභේද | |
| | විනයෙහි ප්‍රයෝජන | |
| | කෙලශ ප්‍රහාණය | |
| 7. | අඞ්ගුත්තර නිකාය | 18 - 21 |
| | හැඳින්වීමක් | |
| | අඞ්ගුත්තර යන නාමය | |
| | විෂය | |
| | හැඳින්වීමක් | |
| 8. | අඞ්ගුත්තර නිකායෙහි අන්තර්ගත විනයාගත කරුණු | 22 - 27 |
| | විනය පිටකය | |
| | පාමොක් | |
| | පාමොක් උදෙසීම | |

9. සඞ්ඝභෙදය 27, 36 - 38

10. උපසම්පදාව 28 - 31

අට්ඨගරු ධම්ම
උපැවිදිවීම

11. ආපත්ති 32 - 36

12. තනතුරු 39 - 44

විනයධර
විනයධර ලක්‍ෂණ
භත්තුද්දෙසක
භික්ෂුප්‍රතිපත්තිය

13. බාල - පණ්ඩිත ලක්‍ෂණ 44 - 45

14. විනයකර්ම 46 - 57

වස්සූපනායික
උක්ඛෙපනීය කම්ම
පත්තනික්කුජ්ජන කම්ම
පටිසාරණීය කම්ම
තජ්ජනීය කම්ම
නියස්ස කම්ම
පබ්බාජනීය කම්ම
පරිවාස
මානත්ත
අබ්භාන

15. චතුර්විධ කර්ම 58 - 59

අපලොකන කම්ම
ඤත්ති කම්ම
ඤත්ති දුතිය කම්ම
ඤත්ති චතුත්‍ථ කම්ම

16. අධිකරණ 59 - 62

විවාදාධිකරණ
අනුවාදාධිකරණ
ආපත්තාධිකරණ
කිච්චාධිකරණ
විවාදමූලික කරුණු

| | | |
|---|---|---|
| 17. | අධිකරණ සමථ | 62 - 66 |
| 18. | අනුවිජ්ජක ලක්ෂණ | 66 - 67 |
| 19. | චතුර්විධ විනය | 67 - 68 |
| 20. | විනය සම්ප්‍රදායගත වෙනත් කරුණු | 69 - 83 |

වග්ග - සමග්ග පිරිස්
පාප - පෙසල භික්ෂු
අනෙසන
ආජීවය
ඉන්ද්‍රිය සංවරය
ආයෙඝීපවාද
ආවාසික භික්ෂු
නිදීම
ගීතස්සර
දන්තකට්ඨ
යාගු
ගිලානොපට්ඨානය
බුද්ධපබ්බජිත
දූත ලක්ෂණ
අගොචර
රජමැඳුර ඇසුරු කිරීම
සමණ සුඛ
පරිහානිකර ධර්ම
පටිසෙවනා පහාතබ්බ ධර්ම
අච්ඡරිය ධම්ම
වෙරඤ්ජසූත්‍රය
සීහ සූත්‍රය

| ආශ්‍රිතග්‍රන්ථ | සංකේත |
| --- | --- |
| අඞ්ගුත්තරනිකාය | අඞ්ගුත්තර හෝ අඞ්ගු. |
| ධම්මපද | ධම්මපද හෝ ධම්ම. |
| චතුභාණවාර පාළි | චතුභාණවාර පාළි |
| මහාවග්ග | මහාවග්ග හෝ මහා. ( බු. බුද්ධජයන්ති ග්‍රන්ථය ) |
| පාරාජික පාළි | පාරාජික පාළි හෝ පාරා. |
| සමන්තපාසාදිකා | සමන්තපාසාදිකා හෝ සමන්ත. ද ස. - පා. |
| සාරත්ථදීපනී | සාරත්ථදීපනී හෝ සාර. |
| විභඞ්ගප්පකරණ | විභඞ්ග. |
| මනෝරථපූරණී | මනෝරථපූරණී හෝ අ. අට්ඨ |
| මහාපරිනිබ්බාණ සුත්ත | මහාපරිනිබ්බාණ සුත්ත |
| චුල්ලවග්ග | චුල්ලවග්ග හෝ චුල්ල. |
| පාචිත්තියපාළි | පාචි. |
| පරිවාරපාළි | පරිවාර. හෝ පරි. |
| කඞ්ඛාවිතරණී | කඞ්ඛා. |

# අඞ්ගුත්තර නිකායාන්තර්ගත විනයසම්ප්‍රදායාගත කරුණු

## නමෝ බුද්ධාය

### බුද්ධශාසනය

සියලු පව් නොකිරීමත්, කුසල් රැස්කිරීමත්, සිත පිරිසිදුකර ගැනීමත් යන මෙය බුදුවරයන්ගේ ඉගැන්වීමයි.[1]

මේ වනාහි බුද්ධශාසනය නම් කුමක්දැයි බුදුරජානන් වහන්සේ විසින්ම පෙන්වා දී තිබෙන අයුරුයි.

බුද්ධශාසනය නම් බුදුවරයන්ගේ ඉගැන්වීමයි. ඒ ඉගැන්වීම ප්‍රතිපත්තිය පදනම්කොට ඇත්තකි. ප්‍රතිපත්තියේ ඵලය නම් ප්‍රතිවෙධයයි. ප්‍රතිවෙධයෙන් තොර ප්‍රතිපත්තියත්, ප්‍රතිපත්තියෙන් තොර ඉගැන්වීමත් නිෂ්ඵලය.

බුදුවරයන් ලොව පහලවන්නේත්, ප්‍රතිපත්ති මාර්ගයක් පෙන්වා දෙන්නේත් ලොකයා දුකින් නිදහස් කරගනු සඳහාය.

ලොකය ජරා - මරණ දෙකින් පරිපීඩිතය. ජරා - මරණ දෙකට හෙතුව ජාතියයි. හෙවත් උත්පත්තියයි. ජාතිය නැති තැන ජරාමරණ පහළනොවෙයි. මේ නිසා දුකින් නිදහස් වනු කැමැත්තා ජාතිය නැතිකළ යුතුය. තනිකර ජාතිය නැතිකළ නොහැකිය. ජාතියටද හේතුවක් තිබේ. ඒ හේතුව නැති කළ විට ජාතිය නැතිවෙයි. ජාතිය නැතිවූ විට ජරා - මරණ පහළ නොවන්නේය. ජරා - මරණ පහළ නොවූ කල්හි ජාතියක් පහල නොවන්නේය. දුකින් මිදීම යයි කියනු ලබන්නේ මෙයයි. මේ සඳහා බුදුවරු අපට උපදෙස් දෙති. ඒ උපදෙශය අපි <u>ශාසන</u> නමින් ව්‍යවහාර කරමු.

### ත්‍රිවිධ ශාසනය

පර්‍යාප්ති - ප්‍රතිපත්ති - ප්‍රතිවෙධ යයි ශාසනය තෙවැදෑරුම්ය. <u>පර්‍යාප්තිය</u> නම් සියලුම දෙශනා ධර්‍මයයි. එනම්: තථ - අවිතථ - අනඤ්ඤථ ලක්‍ෂණයෙන් යුක්තවූ සත්‍යදෙශනායි. <u>ප්‍රතිපත්තිය</u> නම් දුඃඛව්‍යපශම සඞ්ඛ්‍යාත ශාන්තිය සඳහා අනුගමනය කලයුතු ශීල සමාධි ප්‍රඥා යයි කියන ලද අනුපුබ්බපටිපදාවයි. <u>ප්‍රතිවෙධය</u> නම් තත්ප්‍රතිපත්තියෙන් ලබාගන්නා අවබොධයයි.

---

1. සබ්බ පාපස්ස අකරණං - ධම්ම. 101

## <u>ශාසනයේ ආරම්භය</u>

සම්බෝධියෙන් දෙමසකට පසු සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ බරණැස ඉසිපතන අරම්හිදී පස්වගමහණුන් අමතා " මහණෙනි, පැවිද්දා විසින් කාමසුඛල්ලිකානුයොග අත්තකිලමථානුයොග යන අන්ත දෙක නො සෙවිය යුතුය. කාමසුඛල්ලිකානුයොගය හීනය, ග්‍රාම්‍යය, පුහුදුනට අයත්ය උතුමනට අයත් නොවෙයි. අත්තකිලමථානුයොගය දුකිය, උතුමනට අයත් නොවෙයි අවැඩ පිණිස පවතියි. එහෙයින් මේ අන්ත දෙකට නොවැටී මැදුම්පිළිවෙත සෙවිය යුතුය[1] " යි මේ ඇවිසින් පිළිවෙත් දක්වා සසුන් ඇරඹූහ.

මේ ප්‍රථම දෙශනාවේදීම බුදුරජානන් වහන්සේ මුල්තැන දෙන ලද්දේ ප්‍රතිපත්තියටයි. බුදුවරයන්ගේ පහළවීමේ පරමාර්ථය ලොකයාහට සත්‍යාවබොධය කරවීම නම් ඒ සඳහා නියම මාර්ගය පෙන්වා දීම අනිවාර්ය කාරණයයි. ප්‍රථම දෙශනාවෙන් මේ පරමාර්ථය සර්වසම්පූර්ණව සාර්ථක විය. පස්වග භික්ෂූන් අතර ජ්‍යෙෂ්ඨවූ කොණ්ඩඤ්ඤ තෙරණුවෝ සත්‍යාවබොධය කළහ. සෙසු සතර දෙනාද ඒ සඳහා සුදුස්සන් බවට පත්වූහ. දෙවන දින පටන් ඔවුහු ද නිවන් පසක් කළහ. ත්‍රිවිධ ශාසනයාගේ ආරම්භය වූයේ මේ අයුරිනි.

## <u>ශාසනයේ ව්‍යාප්තිය</u>

ප්‍රථම දෙශනාවෙන් ඇරඹුනු ශාසනයෙහි මුල්ම ශ්‍රාවක පිරිස පස්නමකගෙන් පරිමිත විය. විශාල පිරිස් මධ්‍යයට ගොස් දහම් දෙසන්නට බුදුරජානන්වහන්සේ අදහස් නොකළහ. " මෙයම හරිය. සෙසු සියල්ල බොරුයයි "[2] දැඩිව එල්බගත් , මැදහත් අදහස් නොදරණ මුලාවූ ලොකයාට දහම් දෙසීම නිෂ්ඵල ක්‍රියාවෙකැයි සිතූහ. මුලදීම තේරුම්ගත හැකි සුළු පිරිසක් තෝරාගන්නා ලදුයේද එහෙයිනි. අනතුරුව දහම් දෙසන ලදුයේ එක් අයෙකුටය. එනම් <u>යස</u> කුලපුත්‍රටය. ඔහු බරණැස ධනවත් සිටුපුතෙකි. කාමභොගී ජීවිතයක් ගතකළ ඔහුට එයින් ජීවිතය තෘප්ත කට නොහැකි විය. ජීවිතය නිසරු බව කෙමෙන් වැටහී ගියේය. ඔහුට සත්‍යය අවශ්‍ය විය, විමුක්තිය අවශ්‍යවිය. මහරැ හුදකලාවම ගෙයින් බැහැර වූයේය. අරමුණ නොමැතිව ගමන් ගත් ඔහුට බුදුරදුන් හමුවිය. සොයාගිය සත්‍යය ඔහුට ලැබුණේය. බුදුසසුන තව සව්වකුගෙන් පොහොසත් විය. මෙසේ බුදුරදුන්ගේ ධර්මයෙන් දෙවන වරට පලලදුයේ තනි පුද්ගලයෙකි. තෙවන වරට යසගේ පියාය. සිවුවනවරට යසගේ මවුය. පස්වන වරට යසගේ යහළුවෝ සිව්දෙනෙකි. මෙසේ බුදුරජාණෝ මුලදී දහම් දෙසුම ටික දෙනෙකුගෙන් හටම සීමා කර ගත්හ.



1 ~~[illegible]~~ [illegible] සංයුත්ත - ධම්මචක්කප්පවත්තන [illegible] 2 (S.V.420, PTS) , 2 සච්චමෙව • මොඝමඤ්ඤං • ?

ඉක්බිති උන්වහන්සේ හට ලොකු පිරිසකට දහම් දෙසීමේ අවස්ථාව එළඹුනේය. යස හා ඔහුගේ යහළුවන් සිවුදෙනාගේ පැවිද්ද අසන්නට ලැබුනු වෙනත් යහළුවන් සූපනස් දෙනෙක් සිය යහළුවන් " උපැවිදි කරවා ගනුමනා " යි වහසි බෙණෙමින් බුදුරදුන් වෙත පැමිණියහ. මොහ නමැති දැලින් බැඳුනු ඔවුන් සතන් තුල, කළයක් තුල දිලිසෙන පහනක් සෙයින් දිලිසෙන ප්‍රඥාප්‍රදීපය දුටු බුදුරජානන් සදහම් අමා තෙල් වත් කරන්නට වන්හ. ප්‍රඥා ප්‍රදීපය වඩ වඩා දැල්විනි. ආලෝකය පැතිරිනි. සත්‍යය අවබෝධ විය. සම්බුදු සසුන නවක් සූපණස් නමකගෙන් වැඩී ගියේය. මේ තාක් උන් වහන්සේට දහම් දෙසන්නට ලැබුනු විශාලම පිරිස මෙයයි.

ඉන්පසු භද්‍රවර්ගිය තිස්දෙනාය, උරුවෙල කාශ්‍යපාදි තුන් බෑ ජටිලයන් ප්‍රමුඛ දහසක් දෙනාය, කොලිත උපතිස්ස ප්‍රධාන දෙසිය පනසක් දෙනායයි මෙසේ මුල් මාස කිහිපය තුල දහසකට අධික පිරිසක් සත්‍යධර්මය පිළිගෙන ශාසනයට ඇතුළු වූහ. මෙසේ දවසින් දවස මසින් මස වසින් වස බුදු දහම පිළිගන්නෝ අධික වූහ. පැවිදිබිමට පත් වන්නෝ බහුල වූහ. ඒ නිසාම සංවිධානාත්මක වැඩ පිළිවෙළක් අවශ්‍ය විය.

පැවිද්ද

මේ ශාසනයෙහි මුලින් ඇති වූ පැවිදි පිරිස නම් කොණ්ඩඤ්ඤ ආදි පස්වග තවුසෝය. ඔවුහු සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේගේ බුද්ධත්වයටත් පළමුවම තවුස් වෙස් ගෙන පැවිදි වීමට පත්ව සිටියෝ වූහ. බුද්ධ ධර්මය පිළිගැනීමෙන්ම ඔවුන් සිය සව්වන් ලෙස බුදුහු භාර ගත්හ. අලුතෙන් පැවිදි වෙස් ගැන්වීමක් ඔවුනට අවශ්‍ය නොවීය. අනතුරුව ශ්‍රාවක බවට පැමිණි යස ආදි පිරිසේ පැවිද්ද වූයේ එහි භික්‍ෂු උපසම්පදාවය [1] මේ වනතුරුම හිස රැවුළු බාවා කසාවත් හැඳවා තවකඤ්ඤාකය දී පැවිදි කරවීමේ සිරිත බුදුරදුන් අතින් නොවීය.

පස්වග භික්‍ෂූන් ඇතුළු සැටක් පමණ වූ මහරහතන් වහන්සේලා බොහෝදෙනාට හිත සුව පිණිස ලොකයාට වැඩ පිණිස ඒ ඒ දෙස හැසිරෙන ලෙස නියම කොට යවනු ලැබූහ. එසේ යවමින් " මහණෙනි දෙනමක් එක් මගින් නොයව්. දහම් දෙසව්. දහම් නො ඇසීමෙන් පිරිහීමට පත්වන නුවණැත්තන් ඇත්තාහ"යි[2] වදාළහ.

භික්‍ෂූහු ඒ ඒ දෙස චාරිකා කළහ. දහම් දෙසූහ. මේ නව දහම බොහෝ දෙනා සිත් ගන්නා සුලු විය. තමාට හෝ අනුන්ට හෝ කරදර පිණිස නො පවත්නා ඉහාකමයෙහිම අති සිද්ධිය ප්‍රත්‍යක්ෂකළහැකි, න්‍යායානුකූල බුද්ධිගොචර සත්‍ය ධර්මයකැයි වඩාත් ප්‍රිය කරන්නටවූහ.

---

1 එථ භික්ඛවෙ චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායාති, සාව තෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි - මහාවග්ග - 40

2 මහාවග්ග - 42 ( බු - 1957 )

වඩ වඩා දහමිහි ඇලුනෝ, දහම් අනුව හොඳින් දිවිපවත්වනු රිසිවූවෝ පැවිදිද හා උපසම්පදාව ඉල්වන්නට වූහ. තවම පැවිදි කිරීමේ හෝ උපසම්පදා කිරීමේ අවසරය තමන්ට නො ලැබ තුබුණු හෙයින් පැවිදිවනු රිසිවූවන් බුදුරජුන් කරාම පැමිණවූහ. දුර සිට එසේ පමුණුවනු ලබන ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකයන් හටත්, භික්ෂූන් වහන්සේලාටත් එවැනි දුරබැහැර ගමනාගමන හිතකර නොවීය. සුවපහසු ද නොවීය. මේ දුෂ්කරතාව දත් බුදුරජානන් වහන්සේ පැවිදි කරවීමේ බලය භික්ෂූන්ට ද පවරා මෙසේ අවසර දුන්හ. " මහණෙනි නුඹලාම ඒ ඒ දිශාවන්හි ඒ ඒ දනව්හි පැවිදි කටයුතුය. උපසම්පදා කටයුතුය. එය මම අනුදනිමි"[1] කියායි. පළමුකොට ඉසරැවුළු බැවිය යුතුය, කසාවත් අන්දවා තනිපට සිවුර එකස්කොට පෙරවා භික්ෂූන් පා වන්දවිය යුතුය, උක්කුටිකයෙන් හිඳුවා ඇඳිලිබන්දවා තෙවරක් තෙරුවන් සරණ ගැන්විය යුතුය. මෙසේ පැවිදි කරණ පිළිවෙළ ද කියා දුන්සේක.

මෙය සපුන් වදනා පුද්ගලයාගේ පැවිද්දත්, උපසම්පදාවත් විය.[2]

බොහෝ කලක් ගතවනතුරු ශාසනයෙහි පැවිද්දත් උපසම්පදාවත් වූයේ මේ ක්‍රමයෙනි.

ඒ ඒ දිශායෙහි ඒ ඒ ප්‍රදෙශයෙහි පැවිදිකරන්නටත්, උපසම්පදා කරන්නටත්, අවසරදීම, බුදුරදුන් විසින් අනුදත් අපට මුලින්ම හමුවන ප්‍රඥප්තිය සේ සැලකිය හැකිය. එයට පළමු කටයුතු, නොකටයුතු පිළිබඳ පැණවීමක් ගැන සඳහන් නොවෙයි.

මුල්ම ධර්මදූත පිරිස සැට දෙනෙකුන් වහන්සේ ගෙන් පරිමිත වූ නමුදු, පසුව භද්‍රවර්ගීය තිස්දෙනාත් උරුවෙල කාශ්‍යපාදි දහසක් දෙනාත්, ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනාදි දෙසිය පනසක් දෙනාත් එක් වීමෙන් විශාල පිරිසක් විය.

මේ හැම දෙනා වහන්සේ ම ඒ ඒ දිශායෙහි චාරිකා කෙරෙමින් ධර්මදෙශනා කරත්ම මේ අළුත් ධර්මයෙන් ප්‍රමුදිත වූ සිය ගණන් දහස් ගණන් දෙනා සසුන් ගතවන්නට වූහ. පිරිස වැඩිවත් වැඩිවත්ම ඔවුනතර ශ්‍රමණ ආකල්පයට පටහැණිවූ ශකිපැවතුම්ද පහළවිය. එහෙයින්ම ඔවුන් හික්මවීමෙහි ලා ශික්ෂාප්‍රඥප්ති ද අවශ්‍ය විය.

මුල් භික්ෂු පිරිස නිකෙලෙශී රහත් උතුමෝය. වැඩිදෙනෙක් සසුන් ගතවන්නටත් පළමු කවුස් දිවි ගත කල ශ්‍රමණ ආකල්පයෙන් යුක්ත අයවූහ. උන්වහන්සේලාගේ කායවාක් සමාචාර ප්‍රසාදවත වූහ. මහජනයා උන්වහන්සේලා කෙරෙහි වඩ වඩා ඇදී ගියේ එහෙයිනි.

පසුව පැවිදි වූවෝ ආචාර්ය උපාධ්‍යායයන් වෙතින් ශ්‍රමණ ආකල්පය පිළිබඳ හික්මීමක් නොලැබූහ. හැදුම් පෙරවුම් පවා සුපිළිසන්ව නොකළහ. කෑම බීම ඉල්වාගෙණ අනුභව

---

1 " අනුජානාමි භික්ඛවෙ තුම්හෙව දානි තාසු තාසු දිසාසු තෙසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ උපසම්පාදෙථාති". මහාවග්ග - 46, 2 මහාවග්ග - 46 ( බු. 1957 )

2

කරන්නට වූහ.[1] මේ ක්‍රියා මහජනයාගේ අප්‍රසාදයට හේතුවිය. මහජනයා අතර පැන නැඟුණු උද්ඝෝෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් උපාධ්‍යායග්‍රහණය කරන්නටත්, උපාධ්‍යායයන් වෙත හික්මෙන්නටත් බුදුරජාණන්වහන්සේ භික්ෂූන්ට නියම කළහ.[2] ශික්ෂාපද පැණවීමේ ආරම්භය මේ විය.

කල් යත් යත් භික්ෂු සමාජය පුළුල් විය. නා නා දෙශික නා නා ජාතික, නා නා කුලීන පුද්ගලයෝ සසුන් ගතවන්නට වූහ. ඔවුහු නා නාධ්‍යාශ ඇත්තෝ වූහ. ඔවුනතර උදාරාධ්‍යාශ පුද්ගලයන් ශාසනය ගුරුත්වයෙන් ගත් අතර හීනාධ්‍යාශ පුද්ගලයෝ ලිහිල් කොට ගත්හ. ශික්ෂා ප්‍රඥප්තිය අවශ්‍ය වූයේ එබඳු හීනාධ්‍යාශ පුද්ගලයන් නිසාය.

## ශික්ෂා ප්‍රඥප්තිය

සම්බුද්ධත්වයෙන් පසු තථාගත බුදුරජාණන් වහන්සේගේ ආයුෂ්කාලය පන්සාලිස් වසකින් පරිමිත විය. එහි මුල් අවුරුදු විස් පඨමබොධිය නමින්ද, පසුලු අවුරුදු පස්විස්ස පච්ඡිම බොධිය නමින්ද දන්නා ලැබේ. එයින් පඨම බොධියෙහි භික්ෂූන් හික්මවනු සඳහා ශික්ෂා පැණවීමක් නොවිය. ඒ අවධියට අයත් භික්ෂූන් වහන්සේ වැඩි දෙනෙක්ම ආර්ය පුද්ගලයෝ වූහ. උන්වහන්සේ අතර බොහෝ දෙනා බුදුරදුන් හමුවන්නටත් පළමු සසර කළකිරී මොක්ෂ සොයමින් තවුස් දිවි ගතකළාහු වෙති. ශ්‍රමණ ආකල්පය කුමක්දැයි හොඳින් දැන සිටියහ. ශ්‍රමණ ජීවිතයට හානිකරදෑ කිසිවක් නො කළහ. සාමාන්‍ය අවවාද මාත්‍රයකින්ම සම්‍යක්ප්‍රතිපත්තියෙහි පිහිටියහ. මේ නිසාම ඒ මුල් අවදියෙහි ප්‍රාතිමොක්ෂයක් නොවිය. පසුව ඕවාදපාතිමොක්ඛය නමින් දත් " ඛන්ති පරමං තපො තිතික්ඛා " යනාදි ගාථාත්‍රයයම පාතිමොක්ඛය වශයෙන් භාවිතයට පත්විය.

පඨම පාරාජිකාව පණවන ලද්දේ වේරඤ්ජාවේ වසෙන් පසුවය. වේරඤ්ජා වස් සමයෙහි ඇති වූ දුර්භික්ෂය නිසා ආහාරපාන හිඟයෙන් භික්ෂූන් වහන්සේලා කරදරයට පත් වූහ. මේ කාලයෙහි සැරියුත් තෙරණුවන්හට " කවර බුදුවරුන්ගේ ශාසනය බොහෝ කල් පැවැත්තේ ද? කවර බුදුවරුන්ගේ ශාසනය බොහෝ කල් නො පැවැත්තේ ද යන පරිවිතර්කයක් පහල විය. "[3]

මෙවැනි අදහසක් සැරියුත් තෙරුන්හට පහලවන්නට ඇත්තේ බුද්ධශාසනයට හිතකර නොවූ දුෂ්ප්‍රතිපන්න භික්ෂූන් අතර පැතිරී යන බවක් පෙණුනු නිසා විය යුතුය.

සැරියුත් තෙරණුවෝ සිය අදහස බුදුරදුන් හමුවෙහි තැබූහ. විපස්සී, සිඛී, වෙස්සභූ යන බුදුවරුන්ගේ සසුන බොහෝකල් නොපැවැති බවත් කකුසන්ධ, කොණාගමන, කස්සප යන

---

1,2 මහාවග්ග - 94 ( බු. 1957 ) 3 පාරාජිකාපාළි 16

බුදුවරුන්ගේ සසුන් බොහෝකල් පැවැති බවත් බුදුරජානන් වහන්සේ වදාළහ.

විපස්සී ආදී බුදුවරුන්ගේ සමයෙහි භික්ෂූන් අතර දුෂ්ප්‍රතිපත්ති පහල නොවූ හෙයින් සික්ඛාපද පැනවීමක් නොවීය. එහෙත් බුද්ධානුබුද්ධ ශ්‍රාවකයන්ගේ පරිනිර්වාණයෙන් පසු විවිධ පුද්ගලයන් සසුන් ගතවීම නිසා ශාසනාර්බුද පහලවිය. සසුන චිරකල් පැවැත්මට බාධකවූ තර්ජන එල්ලවිය. එබඳු තර්ජන මැඩලීමට ඉදිරිපත්කල යුතු ප්‍රඥප්ති නොවූ හෙයින් සසුන පිරිහී ගිය බව පෙණේ.[1]

ශික්ෂාපද සමූහයක් වශයෙන් භික්ෂූන් එකට බැඳ දන රැහැණක් වැන්න. සූත්‍රයකින් නො අමුණු මල් පුල ගට විසිරී යයි, අමුණු මල් එසේ නොවෙයි. භික්ෂූන් සික්ඛාපදවලින් නොබැඳුනු කල්හි ශාසන පරිහානියක් බැඳුනු කල්හි චිරස්ථිතියත් එබඳුය. විපස්සී ආදී බුදුවරුන්ගේ සසුන් වලට සිදුවූයේ මෙයයි. එසේ නම් ශාසන චිරස්ථිතිය සඳහා ශික්ෂාපද පැණවීම කළ යුතුව තිබුණා නොවේද යන පැණය මෙහිදී ඉදිරිපත් වෙයි. එයට පිළිතුර මෙයයි. එනම් " උපන් කරුණෙහි විනා නූපන් කරුණෙහි ශික්ෂාප්‍රඥප්තිය බුදුවරයන්ගේ ආවේණික ධර්මතාවක් නොවන හෙයිනි". යනුයි.

විවිධතරාතිරම්වලට අයත් පුද්ගලයන් සසුන් ගත වූවිට ශික්ෂාප්‍රඥප්තියක් නොවී නම් ශාසනය චිරස්ථායී නොවන බව බුදුරදුන් පැවසූ විට[2] මෙය සික්ඛාපද පැණවීමට සුදුසු කාලයයි සැරියුත් තෙරණුවෝ අයැද සිටියහ[3].

සම්බුද්ධත්වයෙන් පැහෙන කතිපය කාලයක් දැන් ඉක්ම ගොස් ඇත. ධර්ම ප්‍රචාරක කටයුතු ශීඝ්‍රාකාරයෙන් පැතිර ගිය හෙයින් විවිධ පුද්ගලයෝ සසුන් ගතවූහ. සික්ඛාපද නොපැනවුවහොත් සසුන වැඩි කල් නොපවතිනු ඇතැයි සැලකූ සැරියුත් තෙරණුවෝ සික්ඛාපද පැණවීමට මෙය සුදුසු කලැයි ඇරයුම් කලහ.

එකවිටම බුදුරජුහු මේ අයැදුම නො පිළිගත්හ. ඉදිරියට බලාපොරොත්තු තබා ගන්නා ලෙසත්, සුදුසු අවස්ථාවේ සික්ඛාපද පණවන බවත් වදාළහ. නූපන් කරුණෙහි සික්ඛාපද පැණවීම බුදුවරුන්ගේ ධර්මතාවක් නොවන හෙයිනි මෙසේ බලාපොරොත්තු තබාගන්නා ලෙස සැරියුත් තෙරුන්ට වදාරණ ලදුයේ.

සික්ඛාපද පැණවීමට සඞ්ඝයා අතර ආසවට්ඨානීය ධර්ම පහලවියයුතුය. <u>රත්තඤ්ඤුමහත්ත</u> - වෙපුල්ලමහත්ත - <u>ලාභග්ගමහත්ත</u> - <u>බාහුසච්චමහත්ත</u> යයි සඞ්ඝයා අතර පහලවන මේ කරුණු ආසවට්ඨානීය ධර්මයේ බුදුරජානන් වහන්සේ වදාළහ.

---

1. පාරාජිකා පාළි - 18
2. යෙ තෙ පච්ඡිමා සාවකා නා නා නාමා නා නා ගොත්තා නානාජච්චා නානාකුලා පබ්බජිතා තෙ තං බ්‍රහ්මචරියං ඛිප්පඤ්ඤෙව අන්තරධාපෙසුං - පාරාජිකපාළි - 18
3. එතස්ස භගවා කාලො එතස්ස සුගත කාලො යං භගවා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙය්‍ය, උද්දිසෙය්‍ය පාතිමොක්ඛං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං පාරා-22

සැරියුත් තෙරුන් හා කළ මේ සාකච්ඡා අවස්ථාවෙහි රැස්ව සිටි පන්සියයක් පමණ භික්ෂු සියලුදෙනාම ආර්ය පුද්ගලයෝය. පිරිසිදු පුද්ගලයෝය. අශ්‍රමණික ප්‍රතිපත්ති උන්වහන්සේලා වෙත පහල නොවෙයි.[1] සිකපද පැනවීමට තවම කල් නොවෙතැයි වදාරණ ලද්දේ එහෙයින් වියයුතුය.

බුදුරජාණන්වහන්සේ දක්ෂ වෛද්‍යවරයෙකු වැනිය. රෝගයක් උපන්කල්හිම වෛද්‍යවරයා රෝගියාට පිළියම් කොට රෝගය සන්හිඳුවයි. බුදුරජාණන් වහන්සේත් කරුණක් උපන්කල්හි සිකපද පණවා ශ්‍රාවකයන් ආයත සංවරයෙහි පිහිටුවති. රෝගයක් නූපන් කල්හි පිළියම් කිරීම නිෂ්ඵල කාර්යයක් වන්නාසේම කරුණක් නූපන් කල්හි සිකපද පැනවීමද නිෂ්ඵල කාර්යයකි. කල් ඇතිව සිකපද පණවනලදනම් භික්ෂු ඒවා ගුරුත්වයෙන් නොගනිති. දැන දැන සිකපද මඩිති. ආයති සංවරයෙහි පිහිටීමෙහිද උත්සුක නොවෙති.

## ආසවට්ඨානීය ධම්ම

### 1. රත්තඤ්ඤුමහත්ත

සසුන ඇරඹීමෙන් කලක් ගතවීම නොහොත් පැවිදිබවට පැමිණ කලක් ගතවීම රත්තඤ්ඤු-මහත්ත නම් වෙයි. සසුන ආරම්භයේදී සිත් සතන්හි පහල වන ශාසනික ගෞරවය කල් යත් යත් ලිහිල්වීම ස්වාභාවිකය.පුද්ගලයන් පිළිබඳවත් ස්වභාවය බෙහෙවින් බලපාන බව පෙනේ. සසුන ලිහිල් කොට ගැනීම නිසා දුෂ්ප්‍රතිපත්ති පහළවීම නො වැළැක්විය හැකිය. ප්‍රාතිමෝක්‍ෂ ගත බොහෝ ශික්‍ෂාපද <u>ඡබ්බග්ගිය</u> භික්ෂූන් නිසා පණවන්නට සිදුවිය. පසු කාලයෙහි පැවිදිවූ මේ භික්ෂු හීනාධ්‍යාශ පුද්ගලයෝ වූහ. ලාභ කීර්ති ප්‍රශංසාදිය අපේක්‍ෂාවෙන් විෂමාචාර ඇත්තෝ වූහ. මේ භික්ෂූන් නිසා ශික්‍ෂාසංග්‍රහය විශාල විය.

" න භික්ඛවෙ ඌනදසවස්සෙන උපසම්පාදෙතබ්බො යො උපසම්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස "

" න භික්ඛවෙ බාලෙන අබ්‍යත්තෙන දසවස්සෙන උපසම්පාදෙතබ්බො යො උපසම්පා-දෙය්‍ය ආපත්ති දුක්කටස්ස, අනුජානාමි භික්ඛවෙ ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන දසවස්සෙන වා අතිරෙක දසවස්සෙන වා උපසම්පාදෙතුං "

---

1. නිරබ්බුදො හි සාරිපුත්ත භික්ඛුසඞ්ඝො නිරාදීනවො අපගත කාලකො සුද්ධො සාරෙ පතිට්ඨිතො ඉමෙසංහි සාරිපුත්ත පඤ්චන්නං භික්ඛුසතානං යො පච්ඡිමකො භික්ඛු සො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධි පරායනො " පාරා. 22

මෙවැනි ශික්‍ෂාපද සඞ්ඝයා රත්‍ඤ්ඤුමහත්ත්වයට පැමිණි කල්හි පණවන ලද ශික්‍ෂාපද යයි විනය අටුවාව කියයි.[1]

2. <u>වෙපුල්ලමහත්ත</u>

සඞ්ඝයා සඞ්ඛ්‍යාවෙන් වැඩිවීම වෙපුල්ලමහත්ත නම්වෙයි. එය ආසවට්ඨානීය ධර්මයක් වනුයේ සිවුපසය සෙවීම පිළිබඳව පහළවන නොයෙක් දුෂ්කරතා නිසාය. පිරිස වැඩිවන්විට ආහාර පාන, සිවුරුපිරිකර, සෙනසුන් සෙවීම අපහසුවෙයි. මේ නිසා නොයෙක් විෂම ගති පැවතුම් සඞ්ඝයා අතර පහළවීම නිරායාශයෙන් සිදුවන්නකි.

වෙපුල්ල්‍යමහත්ත්වය නිසා පැණවූ සික්‍ෂපදයේ විනය අටුවාව මෙවැනි සික්‍ෂපද පෙන්වයි.[1]

" යො පන භික්ඛුඅනුපසම්පන්නෙන උත්තරිං ද්විරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං "

" යා පන භික්ඛුනී අනුවස්සං වුට්ඨාපෙය්‍ය පාචිත්තියං "

3. <u>ලාභග්ගමහත්ත</u>

ලාභයෙන් මහත් බවට යෑම ලාභග්ගමහත්ත නම් වෙයි. ශීලාදි ගුණයන්හි පහදනා මහජනයා බෙහෙවින් සිවුපසය භික්‍ෂූන්ට එළවයි. සිවුපසයෙහි ගෙධය, සද්ධාදෙය්‍ය විසර්ජනය, අවෛහඞ්ගිය සඞ්ඝලාභය බෙදා ගැනීම ආදි විෂම පැවතුම් ලාභය නිසා පහළ වෙයි. එහෙයින් ලාභග්ගමහත්තය සික්ඛාපදපඤ්ඤත්තියට කරුණුවූ ආසවට්ඨානීය ධර්මයෙකි. ඒ සඳහා මේ ශික්‍ෂාපදය විනය අටුවාව ඉදිරිපත් කරයි[2].

" යො පන භික්ඛු අචෙලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය පාචිත්තියං "

4. <u>බාහුසච්චමහත්ත</u>

දැන උගත් කමින් උසස් බවට පත්වීම බාහුසච්චමහත්ත නම් වෙයි. ත්‍රිපිටක ධර්ම ඉගෙන නුනුවණින් මෙනෙහි කරන්නා උදම්ව ධර් අධර්ම කෙරෙයි, විනය අවිනය කෙරෙයි මේ නිසා ද සික්‍ෂපද පණවන්නට සිදුවෙයි.

---

1 සමන්තපාසාදිකා 108 ( 1915 )
2 සමන්තපාසාදිකා 108 ( 1915 )

" යො පන භික්ඛු එවං වදෙය්‍ය කථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි – පෙ – සමණුද්දෙසොපි චෙ එවං වදෙය්‍ය "

මෙවැනි සිකපද බාහුසච්චමහත්තය නිසා පණවන්නට සිදුවූ බව කියයි.[1]

## සිකපද පැණවූ කාලය

පඨම බොධියෙහි භික්ෂු සඞ්ඝයා පිරිසිදු පිරිසක් වූ හෙයින් සිකපද පැණවීම අවශ්‍ය නොවූ බව මුලින් සඳහන් කෙළෙමු. සිකපද පණවනු සඳහා සැරියුත් තෙරණුවන් බුදුරදුනට ඇරයුම් කෙළේ වේරඤ්ජාවේ වසෙන් පසුවය. බුදුරදුන් වේරඤ්ජාවේ වස් එළඹ වදාළේ දොළොස්වැනි වසය.[2] වෙරඤ්ජකණ්ඩ සමයෙහි භික්ෂු සඞ්ඝයා ඉතා පිරිසිදු බවත් සියල්ලන්ටම බාල භික්ෂු නම පවා සොතාපන්න බවත් පාරාජික පාලියෙහි ( 22 – බු ) එයි. සිකපද පැණවීමට සැරියුත් තෙරුන් ඇරයුම් කලවිට බුදුරදුන් වදාළේ බලාපොරොත්තුව සිටින ලෙසටය. ( <u>ආගමෙහි ත්වං සාරිපුත්ත</u> – පාරා. – 22 – බු ) මේ අනුව සැලකෙන විට සැරියුත් තෙරණුවන්ගේ ඇරයුම ඉටුවී ඇත්තේ ඇරයුමෙන් අටවසකට පසුවය. මෙතෙක් කල් ඉක්ම යනතුරු භික්ෂූන් උදෙසා කිසිදු ශික්ෂාවක් නොපනවන ලදද යනු සැලකිල්ලට භාජන කලයුතුව ඇත. සමන්තපාසාදිකාම එයට මේ පිළිතුර සපයයි.

" භගවතො කිර පඨමබොධියං වීසති වස්සානි භික්ඛූ චිත්තං ආරාධයිංසු. න එවරූපං [illegible] අජ්ඣාචාරමකංසු ..... අථ භගවා අජ්ඣාචාරං අපස්සන්තො පාරාජිකං වා සඞ්ඝාදිසෙසං වා න පඤ්ඤාපෙසි. තස්මිං තස්මිං පන වත්ථුස්මිං අවසෙසෙ පඤ්ච ඛුද්දකාපත්ති-ඛන්ධෙව පඤ්ඤාපෙසි". සමන්ත – 120 ( 1915 )

පඨම බොධියෙහි නොපණවනලද්දේ කවර සිකපද ද යන වග මෙයින් හෙළිවෙයි. <u>එවරූපං අජ්ඣාචාරං</u> යන්නෙන් අදහස් කරන ලද්දේ ශීල විපත්තියට හේතුවන වැරදිය. සුදින්න වස්තුව අරමුණු කොට මෙහි <u>එවරූපං</u> යන වචනය යොදා ඇතත් මෙයින් පාරාජිකා පත්ති පමණක් අදහස් කරනු නො ලැබේ. ශීල විපත්තියට හේතුවන සඞ්ඝාදිසෙස ද මෙහි සංග්‍රහිතය. දෙවන වැකියෙන් එය පැහැදිලිවෙයි.

චුල්ලවග්ගාදි පඤ්ඤාපත්තීන් පඨම බොධියෙහි පණවනලද බව යට දැක්වූ සමන්තපාසාදිකා පාඨයෙන් හැඟෙයි. එසේ නම් සිකපද පණවන ලෙස සැරියුත් හිමියන් ඇරයුම් කලේත්, ඒ සඳහා බලාපොරොත්තුව සිටින ලෙස බුදුරජුන් වදාලේත් කුමක් හෙයින්ද යන ප්‍රශ්නය පැන නගියි.

---

1 සමන්තපාසාදිකා 108 ( 1915 ), 2 සාරත්ථදීපනී – 401 ( 1914 )

සැරියුත් තෙරණුවන් ඇරැයුම් කරණ ලදුයේ ශාසන චිරස්ථිතිය සඳහා සිකපද පණවන ලෙසය. සපුන පවතිනුයේ භික්ෂූන් සිල්වත්ව සිටිනතුරුය. එහෙයින් භික්ෂූන් ශීලයෙන් නොපිරිහෙනු පිණිස සිකපද පැණවීම අවශ්‍යයයි සැරියුත් තෙරණුවෝ කල්පනා කළහ. ථුල්ලච්චයාදි කුඩා ඇවැත් ආචාරාදි විපත් ගණයට අයත්වෙයි. ඒ නිසා භික්ෂුභාවයට හානි නො පැමිණෙයි. පහසුවෙන් ආයතිසංවරයෙහි පිහිටා සිල් පිරිසිදුකරගත හැකිය. සැරියුත් තෙරණුවන්ගේ ඇරැයුම ශාසන පරිහානියට හේතුවන ශීලවිපත්තිකර ආපත්ති සඳහා සිකපද පණවන ලෙසය.

සෙසු පඤ්චාපත්තිස්කන්ධයට අයත් සිකපද පැණවීමේ ආරම්භය වෙරඤ්ජා වසටත් පඨම පාරාජිකාපත්තිය පැණවීමටත් අතර අටවස තුළදීය යනු කෙවිත් වාදයෙකි. මෙය නොපිළිගත යුත්තක් බවත්, එයින් පළමුත් සිකපද නොපණවනලදැයි නොකියහැකි බවත් සාරත්ථදීපනියේ අදහසයි.[1] ඒ අදහස පිළිගත යුත්තකි. මවුපියන්ගෙන් අවසර නොලත් කුලදරුවන් පැවිදි නොකළ යුතුය. එසේ පැවිදි කිරීම දුකුළා යයි පණවන ලද්දේ රාහුල කුමරුන්ගේ පැවිද්දෙන් ශෝකයට පත් සුදොවුන් රජුගේ ආයාචනයෙනි. " ගිහියනට ඍද්ධිප්‍රාතිහාර්‍ය නොපෑයුතු" යයි පණවන ලද්දේ පිණ්ඩෝලභාරද්වාජ තෙරණුවන් රජගහ සිටුහුගේ සඳුන් පාත්‍රය ඍද්ධිප්‍රාතිහාර්‍ය දක්වා ගැනීම නිමිති කොටය. මුල් අවධියට අයත් මෙවැනි පැණවීම් නොපමණවත් ඇත. එහෙයින් ඛුද්දකාපත්ති පඤ්ඤත්තියේ ආරම්භය වෙරඤ්ජා වසෙන් පසුවය යන කෙවිත් වාදය ප්‍රතිෂ්ඨාරහිතය.

## සික්ඛාපද යන්නෙහි අර්ථ

සියල්ලම එකකයක් වශයෙන් ගත් කල්හි හික්මීම පිළිබඳ උපාය ශික්ඛාපද නම් වෙයි. වෙන් වෙන් ව ගත් කල්හි එක් එක් ශික්ෂාපදයක් හික්මීම පිළිබඳ එක් එක් කොටසකි. මුල් අර්ථයෙහි පද යනු උපායයි. දෙවෙනි අර්ථයෙහි කොටසයි.[2]

දැන දැන බොරුකීම් නිමිත්තෙන් පචිති වේ. ( සම්පජාන මුසාවාදෙ පාචිත්තියං ) මේ පැණවීම නිසා බොරුකීමෙන් වළකී. මෙය වාක් සංවරය ඇති කිරීමෙහි උපායෙකි. එසේම වාක් සංවරය හික්මීම පිළිබඳ එක් කොටසකි. එහෙයින් උපායාර්ථයෙනුත්, කොට්ඨාශ අර්ථයෙනුත් සික්ඛාපදයයි කියනු ලැබේ.

පරමාර්ථ වශයෙන් විරතිය ශික්ෂාපදයෙකි. චේතනාවත් ශික්ෂාපදයෙකි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වළකිමියි සමාදන් වන්නහට ලැබෙන විරති චෛතසිකය නිෂ්පර්‍යාය වශයෙන් ශික්ෂාපදයෙකි. සහජාත වශයෙන් ලැබෙන අවශේෂ චිත්ත චෛතසික ධර්ම පර්‍යාය



1 සාර. - 401 ( 1914 ), 2 සමන්ත. - 126 ( 1915 )